# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.02.16 මාධ්‍ය නිවේදන අංක: 2025/014

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>ගම්පහ ශ්‍රී බෝධි විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයෙකුට සිර දඬුවම් නියම කෙරේ, අත්හිටුවීමේ නියෝග නොමැත.</u>**

2015 වර්ෂයේ දී පහ ශ්‍රේණිය සඳහා ගම්පහ මාබිම ප්‍රාථමික විද්‍යාලයේ දරුවෙකු, ගම්පහ තක්ෂිලා විද්‍යාලයට ඇතුළත් කිරීමේ චේතනාව සහ දැනුම ඇතිව ගම්පහ ශ්‍රී බෝධි විද්‍යාලයට අතුළත් කර ගැනීම යටතේ ගම්පහ ශ්‍රී බෝධි විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයෙකු වූ ටිකිරි බංඩාර සේනානායකගේ වික්‍රම සේනානායක යන චූදිතට විරුද්ධව දූෂණය චෝදනාව යටතේ අධිචෝදනා ගොණු කර තිබුණි. එහි දී නියමිත ක්‍රමවේදයෙන් බැහැරව එනම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගේ නිසි අනුමැතියකින් තොරව දරුවා ගම්පහ තක්ෂිලා පාසැලට ඇතුළත් කරවීමේ චේතනාවෙන් විදුහල්පති විසින් දරුවා ගම්පහ ශ්‍රී බෝධි විද්‍යාලයට ඇතුළත් කරගැනීම සිදු කර ඇති බව විමර්ශනයේ දී අනාවරණය විය.
2025.02.10 වන දින නඩුව විභාගයට ගන්නා අවස්ථාවේ දී චූදිත වරද පිළිගනු ලැබූ අතර, පැමිණිල්ලේ නීතීඥවරිය අධිකරණයෙන් ශිෂ්‍යත්ව විභාගය වැනි මධ්‍යම පාන්තික දරුවන්ගේ ඉරණම විසඳන කරගකාරි විභාගයකින් සමත්ව එන දරුවෙකුට තිබූ අවස්ථාව අහිමි කිරීම සහ එකී හානිය ප්‍රතිපූර්ණය කළ නොහැකි බව මෙන් ම ප්‍රජාව කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම සහ එකී කරුණ ආශ්‍රිතව පාසල් පද්ධතියෙන් අල්ලස හා දූෂණය තුරන් කරනු වස් සමාජයට ආදර්ශයක් සැපයිය හැකි දඬුවමක් ලබාදෙන ලෙස අල්ලස් හේ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් ඉල්ලා සිටින ලදි.

එකී සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව, ගරු මහාධිකරණ විනිසුරු තැන්පත් සුජීව නිශ්ශංක විනිසුරුතුමා විසින් චූදිතට වසර 03ක ලිහිල් සිර දඬුවම් නියම කරන ලද අතර, අත්හිටුවීමේ නියෝගයක් නිකුත් නොකරන ලදි. වැඩිදුරටත් දඬුවම් වශයෙන් රුපියල් ලක්ෂයක දඩයක් නියම කළ අතර, නොගෙවන්නේ නම්, මාස 03ක ලිහිල් සිර දඬුවම් නියම කරන ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672